**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩ සටහන - 3 කොටස - 2019**

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩ සටහනේ - 3 කොටසේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 අගෝස්තු 11 දින එළඹි අංක 3348 සහ 3349 දරන ණය ගිවිසුම් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

ණය ගිවිසුම්වලට අනුව එවකට පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහනගර සභාව සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කිලෝමීටර 29.4 ක මලාපවහන ජාල එලීම සහ පොම්පාගාර 3 ක් ඉදිකිරීම ඇතුළුව දකුණු පෝෂක ප්‍රදේශයේ අපජල පවිත්‍රාගාර පුනරුත්තාපනය සහ පුළුල් කිරීම සහ ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම හා සේවා සපයන්නන්ගේ ධාරිතා වර්ධනය වැඩ සටහනේ අරමුණ වේ. ණය ගිවිසුම්වලට අනුව, වැඩසටහනේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 16,401.76 කට සමාන එජඩො මිලියන 112.83 ක් වූ අතර ඉන් රු.මිලියන 13,471.16 කට සමාන එජඩො මිලියන 92.67 ක් ආසියානු සංවර්ධන බැංකුව මඟින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 2,930.60 කට සමාන එජඩො මිලියන 20.16 ක් ශ්‍රී ලංකා රජය මූල්‍යනය කිරීමට අපේක්ෂා කර තිබුණි. වැඩසටහන එහි කාර්යයන් 2016 නොවැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

වැඩසටහනේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.2** නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 6 (01) (අ) වගන්තිය | පිරිවැය රු.මිලියන 5 හෝ ඊට වැඩි කොන්ත්‍රාත් පිළිගත් කොන්ත්‍රාත්කරුවන් විසින් කොන්ත්‍රාත්තුව අත්සන් කිරීමෙන් පසු දින 60 ක් ඇතුළත පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි විය යුතුය. තවද කොන්ත්‍රාත් ගිවිසුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ යුතුය. කෙසේවෙතත්, සිවිල් ඉදිකිරීම් සහ සැපයුම් සම්බන්ධ කොන්ත්‍රාත්කරුවන් මෙම අවශ්‍යතාවයන්ට අනුකූල වී නොතිබුණි. | නීතිමය සහ බදු සම්බන්ධ ගැටළු මත කොන්ත්‍රාත්කරුවන්ට එරෙහිව පියවර ගැනීමට නොහැකි වේ. | නීතිමය අවශ්‍යතාවන් සමඟ අනුකූලවීමට කොන්ත්‍රාත්කරුවන්ට දැනුම්දීමට පියවර ගෙන තිබුණි. | මෙම අවශ්‍යතාවන් සමඟ අනුකූලවීමට කොන්ත්‍රාත්කරුවන්ට පෙළඹවීමට පියවර ගැනීමට අවශ්‍ය වේ. |

**3.** භෞතික කාර්යසාධනය

**3.1** වැඩසටහනේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

මහ කොළඹ ප්‍රදේශයේ මිරිදිය ජලයේ සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂක තත්ත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින් (අ) කොළඹ දකුණු පෝෂක ප්‍රදේශයේ අපජල පද්ධතිය පුනරුත්ථාපනය සහ පුළුල් කිරීම (ආ) දකුණු පෝෂක ප්‍රදේශයේ ද්විතික අපජල පවිත්‍රාගාරය ඉදිකිරීම සහ (ඇ) ආයතනික ව්‍යුහයේ සහ සේවාවේ ධාරිතාවය ශක්තිමත් කිරීම යනාදී ප්‍රධාන සංරචක 3ක් යටතේ වැඩසටහනේ කටයුතු ක්‍රියාත්මක කර තිබුණි. ලැබී තිබුණු තොරතුරු අනුව, ණය නියෝජිත ආයතනය මගින් කරන ලද රු.මිලියන 13,471.16 කට සමාන එ.ජ.ඩො මිලියන 92.67 ප්‍රතිපාදනයෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2,151.79 කට සමාන එ.ජ.ඩො මිලියන 12.59 ක් පමණක් වැඩසටහනේ කටයුතු ආරම්භ කර වර්ෂ 3 ක් ගතවීමෙන් පසු උපයෝජනය කර තිබුණි. කෙසේවෙතත්, ඉතිරි වර්ෂයක කාලපරිච්ඡේදය තුළදී වැඩසටහනේ කටයුතු සඳහා මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කිරීමේ හැකියාව පිළිබඳ සැකයක් පවතී. වැඩසටහන මගින් ක්‍රියාත්මක කරන ලද කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

| සංරචකය | විගණන ගැටළු | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) කිරුළපන පෝෂක ප්‍රදේශය සඳහා නව ගුරුත්වාකර්ෂණ මලාපවහන | අපේක්ෂිත භෞතික කාර්යසාධනය සියයට 95ක් වුවද වැඩසටහන සියයට 39ක් පමනක් අත්කරගෙන තිබුණි. | වැඩසටහන සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදුවීම සහ වැඩසටහනේ කාලපරිච්ඡේදය | කොන්ත්‍රාත්කරුගේ දුර්වල සැලසුම්කරණය සහ අවශ්‍ය සම්පත් නොයෙදවීම හේතුවෙන් අවශ්‍ය | ව්‍යාපෘති කළමණාකරන ඒකකය අමතර පිරිවැය සහ වැඩසටහන අවසන් කිරීමේ |

| | | | | |
|---|---|---|---|---|
| ජාලයක් සහ පීඩන මාධස්ථාන සැපයීම. | කොන්ත්‍රාත්කරුගේ දුර්වල සැලසුම්කරණය, සම්පත් නොයෙදවීම සහ කොන්ත්‍රාත්කරුට තලකොටුව වත්ත ඉඩම භාරදීමේ ප්‍රමාදයන් හේතුවෙන් අඩු ප්‍රගතියක් දැක්වීය. | තුලදී අපේක්ෂිත අරමුණු අත්කර ගැනීමට නොහැකිවේ. | මට්ටමේ බිල්පත් වටිනාකම අයකර නොගැනීම නිසා දුර්වල කාර්යසාධනයක් අඛණ්ඩව පැවතුණි. | ප්‍රමාදයන් වැලැක්වීමට නිසි නියාමන සහ සුපරීක්ෂණ ක්‍රමවේදයක් අනුගමනය යුතුය. |
| (ආ) වැල්ලවත්ත අපජල පවිත්‍රාගාරය ඉදිකිරීම | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබාගැනීමට කැබිනට් සංදේශය ඉදිරිපත් කිරීමට අපේක්ෂාවෙන් සිටී. | වැඩසටහනේ කාලපරිච්ඡේදය තුලදී අපේක්ෂිත කටයුතු සහ අරමුණු අත්කර ගැනීමට නොහැකිවේ. | කැබිනට් පත්‍රිකාව ඉදිරිපත්කර තිබුණු අතර 2020 ජුලි ලංසු ප්‍රදානය කල හැක. | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ඇ) කිරුල - නාරාහේන්පිට ප්‍රදේශය සඳහා මලාපවහන පහසුකම් සැපයීම. | ඉඩම් නොමැතිවීම හේතුවෙන් ලංසු ලියවිලි අනුමත කිරීම ප්‍රමාද වී තිබුණි. | වැඩසටහනේ කාලපරිච්ඡේදය තුලදී අපේක්ෂිත කටයුතු සහ අරමුණු අත්කර ගැනීමට නොහැකිවේ. | කොළඹ මහනගර සභාව විසින් මෙම අරමුණු සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉඩමක් කල්බදු කර ඇති අතර ක්‍රියාවලිය දැනටමත් අවසන් වී ඇත. කෙසේවෙතත් ප්‍රමාණවත් අරමුදල් නොමැතිවීම හේතුවෙන් ක්‍රියාවලිය තාවකාලිකව නවතා ඇත. | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ඈ) දකුණු පෝෂක ප්‍රදේශයේ දෝෂ සහිත මලාපවහන අළුත්වැඩියාව සහ අඩු ධාරිතාවයෙන් යුත් මලාපවහන ඉහල නැංවීමේ සහ ක්‍රියාත්මක කිරීම. | තාක්ෂණික ඇගයීම් කමිටුව සහ අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව පත්කිරීමේ ප්‍රමාද වී තිබුණු අතර සංශෝධිත ලියවිලි අනුමත කරගත යුතු වේ. | වැඩසටහනේ කාලපරිච්ඡේදය තුලදී අපේක්ෂිත කටයුතු සහ අරමුණු අත්කර ගැනීමට නොහැකිවේ. | පැකේජයේ ස්වභාවය, අමාත්‍යාංශයේ විෂය පථය කලින් කලට වෙනස්වීම සහ රටේ පැවති තත්ත්වය තාක්ෂණික ඇගයීම් කමිටු සහ අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව පත්කිරීමේ ප්‍රමාදයන් සිදුවීමට හේතුවිය. | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට කඩිනම් පිවර ගැනීම අවශ්‍ය වේ. |
| (ඉ) පොල්වත්තේ සිට බම්බලපිටිය දක්වා මිලිලීටර 1200ක කොන්ක්‍රීට් බදක් සහිත | තාක්ෂණික ඇගයීම් කමිටුව සහ අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව පත්කිරීමේ ප්‍රමාදවී තිබුණු අතර ලංසු | වැඩසටහනේ කාලපරිච්ඡේදය තුලදී අපේක්ෂිත කටයුතු සහ අරමුණු අත්කර | මෙම යෝජනාව අවලංගු කර ඇත. | වැඩසටහනේ අරමුණු අත්කර ගත නොහැකි වේ. |

| | | |
|---|---|---|
| මලාපවහන ජාලය ඉදිකිරීම. | ලියවිලි සඳහා අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලැබිය යුතුය. | ගැනීමට නොහැකිවේ. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන ගැටළු<br>------------------ | බලපෑම්<br>------- | කළමණාකරනයේ ප්‍රතිචාර<br>---------------------------- | විගණකගේ නිර්දේශ<br>----------- |
|---|---|---|---|
| **1. <u>කිරුළපන මලාපවහන ජාලය සහ පොම්පාගාර 2ක් ඉදිකිරීම</u>** | | | |
| (අ) 2017 මැයි 04 වන දින කොන්ත්‍රාත් ගිවිසුම අත්සන්කර ඇති අතර 2020 මැයි 14 මුල් අවසන් කිරීමේ දිනය විය. මෙම කොන්ත්‍රාත්තුව සඳහා පොම්පාගාර දෙකක් ඉදිකිරීමට ඉඩම් 02 ක් අවශ්‍ය විය.කෙසේවෙතත් 2019 දෙසැම්බර් 31 තෙක් කොන්ත්‍රාත්කරු වෙත තලකොටුව ඉඩම භාරදී නොතිබුණි.<br><br>(ආ) කෙසේවෙතත්, වැඩබිම නොමැති වීම හේතුවෙන් සිදුවූ ප්‍රමාදය නිසා කොන්ත්‍රාත්කරු පාඩු ආවරණය කර ගැනීම සඳහා 2019 ඔක්තෝබර් 14 දින රු.257,171,849 ක හිමිකම්පෑමක් සිදුකර තිබුණි. | (අ) සැලසුම් කරන ලද කටයුතු අවසන් කිරීමේ ප්‍රමාදයන් සිදුවේ.<br><br>(ආ) වැඩසටහන මත අමතර පිරිවැය සහ බැඳීම් ගාස්තු දැරීමට සිදුවේ.<br><br>(ඇ) ප්‍රතිලාභීන් වෙත අපේක්ෂිත පහසුකම් නොලැබේ. | (අ) තලකොටුව වත්ත ඉඩම කොන්ත්‍රාත්කරු වෙත භාරදීමේ ප්‍රමාදයන් හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ සුළු බලපෑමක් ඇත.<br><br>(ආ) තලකොටුව පොම්පාගාරය ඉදිකිරීමට සමාන කාලිංග මාවතේ පොම්පාගාරය ඉදිකිරීමේ දුර්වල ප්‍රගතිය සලකන විටදී තලකොටුව ඉඩම භාරදීමේ ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත්කරු සම්පූර්ණයෙන්ම නිෂ්කාර්ය බව සැලකිය නොහැක. කොන්ත්‍රාත්කරු සැලසුමෙන් ඉතා පිටුපසින් පැවතීම නිසා කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද අලාභ අයකර ගත හැක. තලකොටුව වත්ත ඉඩම භාරදීමේ ප්‍රමාදය හේතුවෙන් ගෙවීමට සිදුවන වන්දිය හිමිකම් ඉල්ලන ලද මුදලට සමාන නොවේ. | (අ) ඉඩම ඉක්මණින් භාරදීමට පියවර ගතයුතුය.<br><br>(ආ) ව්‍යාපෘති කළමණාකරන ඒකකය වැඩසටහනේ කටයුතු අවසන් කිරීමේ ප්‍රමාදයන් සහ අමතර පිරිවැය ඇතිවීම වැලැක්වීමට ශක්‍යතා අධ්‍යන සහ ලංසු ක්‍රියාවලිය පිළිබඳ නිසි නියාමන සහ සුපරීක්ෂණ කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) ව්‍යාපෘති කළමණාකරන ඒකකය 2020 පෙබරවාරි 10 දින ඉඩම මිළදී ගැනීම සඳහා ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව වන රු.9,840,000ට වඩා වැඩියෙන් (65%) රු.25,000,000 ගෙවා තිබුණි. | | (ඇ) පොම්පාගාරය ඉදිකිරීම සඳහා සැලසුම් අදියරේදී තෝරා ගන්නා ලද කුඹිකැලේ ඉඩම වෙනස්වීම හේතුවෙන් යාබද ඉඩම් කොටස් මිලදී ගැනීමට සිදුවිය.දිස්ත්‍රික් ලේකම් මගින් අත්කර ගැනීම වැනි සියළුම විකල්ප යොදා ගැනීමෙන් පසු සෘජු මිලදී ගැනීම් ක්‍රමය අනුගමනය කර ඇත. කෙසේවෙතත් මෙම ක්‍රියාවලිය ප්‍රමාදවූ අතර කොන්ත්‍රාත්කරුට ඉඩම භාරදීමේ ප්‍රමාද වීම හේතුවෙන් රු.9,840,000 වඩා වැඩි පිරිවැයකට මිලදීගැනීමට අනුමත බලධාරීන්ට හේතු ඉදිරිපත් කර අවසානයේ දී සෘජු මිලදී ගන්නා ලදී. | |
| **2. <u>වැල්ලවත්ත අපජල පවිත්‍රාගාරය ඉදි කිරීම.</u>** | | | |
| අපජල පවිත්‍රාගාරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2018 ඔක්තෝබර් 26 දින ප්‍රදානය කිරීමට සැලසුම්කර තිබු අතර 2021 පෙබරවාරි 04 දින වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත් කොන්ත්‍රාත්තුව 2019 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රදානය කර නොතිබුණි. | ප්‍රතිලාභීන් වෙත අපේක්ෂිත පහසුකම් නොලැබීමට ඉඩ ඇත. | මධ්‍යම පරිසර අධිකාරිය මගින් සමුද්‍රය බැහැර කිරීමේ ප්‍රමිතින් වෙනස් කිරීම සහ අමතර 04 එකතු කිරීම සහ අනාගත ලංසුකරුවන් විසින් මතු කරන ලද බොහෝ ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම වැනි හේතු නිසා ප්‍රධාන වශයෙන් ප්‍රමාද විය. තවද කොවිඩ් 19 වසන්ගත ව්‍යාප්තිය හේතුවෙන් කොන්ත්‍රාත් ප්රදානය ප්‍රමාද විය. කෙසේවෙතත් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත්කර ඇති අතර 2020 ජුලි කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සැලසුම් කර තිබේ. | තවදුරටත් ප්‍රමාදවීමකින් තොරව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| **3. <u>කිරුළ - නාරාහේන්පිට ප්‍රදේශය වෙත මලාපවහන පහසුකම් සැපයීම</u>** | | | |
| පොල්වත්තේ සිට බම්බලපිටිය දක්වා කොන්ක්‍රීට් බදක් සහිත | ප්‍රතිලාභීන් වෙත අපේක්ෂිත පහසුකම් | පොම්පාගාර 2 ක ඉදිකිරීම සඳහා ඉඩම් නොමැතිවීම | වැඩසටහනේ අරමුණු අත්කරගත නොහැකි |

| | | | |
|---|---|---|---|
| මලාපවහන ජාලය ඉදිකිරීමේ සහ දකුණු පෝෂක ප්‍රදේශයේ දෝෂ සහිත මලාපවහන අළුත්වැඩියාව සහ අඩු ධාරිතාවයෙන් යුත් මලාපවහන ඉහල නැංවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ කොන්ත්‍රාත්තුව 2018 දෙසැම්බර් ප්‍රදානය කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, 2019 දෙසැම්බර් 31 දක්වා ප්‍රදානය කර නොතිබුණි. | නොලැබීමට ඉඩ ඇත | හේතුවෙන් කිරුළ - නාරාහේන්පිට මලාපවහන ජාලයේ සැලසුම්වල වෙනස්කම් කිහිප වතාවක් සිදු කිරීම සිදු විය. ලංසු ලියකියවිලි සකස් කිරීමේ ප්‍රමාදයන් සඳහා මෙය හේතු විය.ඉඩම් පිළිබඳ අවසානයකින් තොරව සමීක්ෂණ හා විමර්ශන සිදුකල නොහැක.ඉඩම් පිළිබඳ අවසානයක් විමෙන් පසුවද ඉඩමේ අයිතිය තක්සේරුව සඳහා කල් ගත වේ. | වේ. |
| 4. **<u>පොල්වත්තේ සිට බම්බලපිටිය දක්වා බදක් සහිත මලාපවහන ජාලය ඉදිකිරීම</u>** | | | |
| මිලිලීටර 1200ක කොන්ක්‍රීට් බද ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2019 දෙසැම්බර් 31 දක්වා ප්‍රදානය කර නොතිබුණි. වැඩසටහන සැලසුම්කරණය සහ ලංසු කැඳවීමේ අදියරේ පවතී. | ප්‍රතිලාභීන් වෙත අපේක්ෂිත පහසුකම් නොලැබීමට ඉඩ ඇත. | මෙම යෝජනාව අවලංගු කර ඇති අතර කොල්ලුපිටිය සිට බම්බලපිටිය දක්වා යෝජිත සමුද්‍රීය නගර සඳහා ඉඩම් ගොඩකිරීම ව්‍යාපෘතියේ ආරම්භක අදියරේ පැවතින අවිනිශ්චිත බව හේතුවෙන් ප්‍රධාන වශයෙන් අපේක්ෂිත විෂය පථය වෙනස් ආකාරයෙන් වෙනස්වී ඇත. | වැඩසටහනේ අරමුණු අත්කර ගත නොහැකි වේ. |
| **5. <u>දකුණු පෝෂක ප්‍රදේශයේ මලාපවහන පද්ධතිය පුනරුත්තාපනය සහ වැඩිදියුණු කිරීම.</u>** | | | |
| සැලසුම් සහ ලංසු ලියවිලි සකස් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් කොන්ත්‍රාත්තුව 2019 දෙසැම්බර් 31 දක්වා ප්‍රදානය කර නොතිබුණි. | ප්‍රතිලාභීන් වෙත අපේක්ෂිත පහසුකම් නොලැබීමට ඉඩ ඇත. | යෝජනාවල ප්‍රමුඛත්වය වෙනස් වීමෙන් පසු 3කොටසේ ETB සංරචකය යටතේ පවතින ඉතිරි අරමුදල් සමග ගැලපෙන පරිදි විෂය පථය වෙනස් වී ඇත. ප්‍රමුඛත්වය වෙනස්වීම සහ විෂය පථය වෙනස්වීම හේතුවෙන් ලංසු කැඳවීම ප්‍රමාද විය. | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍යවේ. |

### 3.3 පාරිසරික කරුණු සම්බන්ධ ගැටළු

| විගණන ගැටළු | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිරික්ෂණ |
|---|---|---|---|
| 2018 ඔක්තෝබර් 22 දින සිට බලපැවැත්වෙන පරිදි ව්‍යාපෘතියේ පරිසර නිලධාරියා ඉවත්ව තිබුණි. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ පාරිසරික කාර්ය සාධනය නිරන්තරයෙන් නියාමනය කළ යුතු අතර ඒ පිළිබඳ වාර්තා ණය නියෝජිතායතනය වෙත අර්ධ වාර්ෂිකව ඉදිරිපත් කළ යුතුය. | ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව පාරිසරක තක්සේරු නිරන්තරයෙන් සිදුකිරීමට නොහැකි වේ. | පරිසර නියාමන අවශ්‍යතාවය සමහ අනුකූල වීම සහතික කිරීම සඳහා තාවකාලික විධිවිධාන යොදා ඇත. පුරප්පාඩුව පිරවීම සඳහා දැනටමත් පියවර ගෙන ඇත. | ව්‍යාපෘතියේ කටයුතු පරිසරයට සංවේදී බැවින් මෙම අවශ්‍යතාවය අනිවාර්ය වේ. එම නිසා පරිසර නිලධාරියකු බඳවා ගැනීම සඳහා කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටළු

| | කාර්ය මණ්ඩල තනතුරු | 2019 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තත්ත්වය | | | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|---|
| | | අනුමත | තත්‍ය | පුරප්පාඩු සංඛ්‍යාව | | | |
| 01. | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක (ඉංජිනේරු) | 02 | 01 | 01 | ව්‍යාපෘතියේ කටයුතු වල සුමට ක්‍රියාකාරිත්වයට බලපානු ඇත. | ප්‍රධාන තනතුරු බඳවා ගැනීමට සහ රඳවා ගැනීමට කිහිප වතාවක් උත්සාහ කරන ලදී. 2019 සැප්තැම්බර් සියළු පුරප්පාඩු තනතුරු සඳහා අයදුම්පත් කැඳවා ඇත. ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්කිරීම නිසා බඳවා ගැනීමේ ක්‍රියාවලිය තාවකාලිකව නවතන ලද අතර මැතිවරණයෙන් පසු නැවත ආරම්භ කරන ලදී. කෙසේවෙතත් වර්තමානයේ පවතින කොවිඩ් -19 වසංගතය හේතුවෙන් තනතුරු දැනටමත් පුරප්පාඩුව පවතී. ක්‍රියාවලිය නැවත ආරම්භ කිරීමට පියවර ගෙන තිබුණි. | සුදුසු කාර්යමණ්ඩලයක් සහිතව පුරප්පාඩු 12 පිරවීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| 02. | ව්‍යාපෘති ඉංජිනේරු (ප්‍රසම්පාදන) | 01 | - | 01 | | | |
| 03. | ව්‍යාපෘති ඉංජිනේරු | 10 | 07 | 03 | | | |
| 04. | පරිසර නිලධාරි | 01 | - | 01 | | | |
| 05. | ව්‍යාපෘති ලේකම් - 1 | 02 | 01 | 01 | | | |
| 06. | සහකාර ව්‍යාපෘති ඉංජිනේරු-II | 07 | 05 | 02 | | | |
| 07. | කළමණාකාර සහකාර -II | 05 | 03 | 02 | | | |
| 08. | ඉදිකිරීම් කළමණාකරු | 02 | 01 | 01 | | | |
| | | **30** | **18** | **12** | | | |

### 3.5 පද්ධති හා පාලනයන්

| විගණන ගැටළුව | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ----------------- | ----------- | ----------------------------- | -------------- |
| කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ 2000 දෙසැම්බර් 26 දිනැති අංක 10 දරණ චක්‍රලේඛයේ 8.1 වගන්තියේ අවශ්‍යතා අනුව වැඩසටහනේ කාර්ය මණ්ඩලයේ වාර්ෂික කාර්යසාධනය සිදුකර නොතිබුණි. | කාර්ය මණ්ඩලය දිරිගැන්වීමේ අරමුණින් වාර්ෂික ඇගයීම සිදුකිරිම අවශ්‍ය වේ. | සියළුම තනතුරුවල ගිවිසුම් වර්ෂයක කාලපරිච්දයකට යටත්වන අතර කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයට අනුව කාර්යසාධන ඇගයීම පදනම්ව සේවා ගිවිසුම් දිර්ඝ කරනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලවීම අවශ්‍ය වේ. |